# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 16 දරන මුදල් හා ලංකා රජයේ උකස් බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 අප්‍රේල් මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 මැයි මස 4 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබා ගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 16 දරන මුදල් හා ලංකා රජයේ උකස් බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 අප්‍රේල් මස 10 වන දින]

එල්. ඩී.—ඕ. 36 /71.

**1963 අංක 11 දරන මුදල් පනත හා ලංකා රජයේ උකස් බැංකු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 16 දරන මුදල් හා ලංකා රජයේ උකස් බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ — ලුහුඬු නාමය.

## I වන කොටස

### 1963 අංක 11 දරන පනතට කරනු ලබන සංශෝධන

**2.** මෙහි මින්මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන 1963 අංක 11 දරන මුදල් පනතෙහි 71 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1963 අංක 11 දරන පනතේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන හා (2) වන උපවගන්ති ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට පහත සඳහන් අලුත් උප වගන්ති ආදේශ කිරීමෙන් :—

'(1) නියමිත දිනයට පෙර හෝ පසුව වුවද 1952 ජනවාරි මස පළමුවන දිනට කලින් නොවන දිනයකදී, යම් කෘෂිකාර්මික, නේවාසික හෝ ව්‍යාපාරික ස්ථාන යක්—

(අ) ඒ ස්ථානයෙහි (මේ පනතේ මේ කොටසෙහි මින්මතු " මුල් අයිතිකරු " යනුවෙන් සඳහන් කරනු ලබන) අයිතිකරුට විරුද්ධව අධිකරණයක් විසින් කරනු ලැබූ උකස් නඩු තීන්දු ප්‍රකාශයක් ක්‍රියා වෙහි යෙදවීමේ දී විකුණනු ලැබූ බවට; හෝ

(ආ) ඒ ස්ථානයෙහි (මේ පනතේ මේ කොටසෙහි මින්මතු " මුල් අයිතිකරු " යනුවෙන් සඳහන් කරනු ලබන) අයිතිකරු හෝ ඔහුගේ උරුමකරුවන්, බුදල් බලකරුවන් හෝ බුදල් පරිපාලකයන් හෝ විසින් අන් යම් තැනැත්තකු වෙත හෝ අන් යම් තැනැත්තකුගේ උරුමකරුවන්, බුදල් බලකරුවන් හෝ බුදල් පරිපාලකයන් වෙත ඒ අන් තැනැත්තාහට මුල් අයිති කරුගෙන් හෝ ඔහුගේ පූර්වගාමියාගෙන් හෝ අයවිය යුතු වූ ද, පැවරීමට පෙරාතුව ම පැවැති ඒ ස්ථානය පිළිබඳ උකසකින් සුරක්ෂිත කරනු ලැබුවා වූ ද ණයක් ගෙවීම සඳහා පවරනු ලැබූ බවට ; හෝ

(ඇ) ඒ ස්ථානයෙහි (මේ පනතේ මේ කොටසෙහි මින්මතු "මුල් අයිතිකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) අයිතිකරු විසින් හෝ ඔහුගේ උරුමකරුවන්, බුදල් බලකරුවන් හෝ බුදල් පරිපාලකයන් විසින්, ඒ ස්ථානයෙහි උකස් හිමියකුට මුල් අයිතිකරුගෙන් හෝ ඔහුගේ පූර්වගාමියාගෙන් අයවිය යුතු වූ ද පැවරීමට පෙරාතුව ම පැවති ඒ ස්ථානය පිළිබඳ උකසකින් සුරක්ෂිත කරනු ලැබුවා වූ ද ණයක් හෝ ඉන් කොටසක් ගෙවීම සඳහා ඒ උකස් හිමියාගේ ඉල්ලීම පිට අන් යම් තැනැත්තකුට පවරනු ලැබූ බවට ; හෝ

(ඇ) ඒ ස්ථානයෙහි අයිතිකරු විසින් ඒ ස්ථානය පැවරීම සඳහා ප්‍රතිඥාවක් වශයෙන් අන් යම් තැනැත්තකුගෙන් මුදලක් ලබා ගැනීමෙන් පසු, (මේ පනතේ මේ කොටසෙහි මින් මතු "මුල් අයිතිකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) පැවරුම්කරු විසින් පොලී ඇතිව හෝ නැතිව නිශ්චිතව සඳහන් කාලයක් ඇතුළත ඒ මුදල ආපසු ගෙවනු ලැබූ විට ඒ අන් තැනැත්තා ඒ ස්ථානය ආපසු පැවරිය යුතු ය යන කොන්දේසිය පිට ඒ අයිතිකරු විසින් ඒ අන් තැනැත්තාට පවරනු ලැබූ බවට

බැංකුව සෑහීමට පත් වුවහොත්, ඒ ස්ථානය සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් අත්කර ගැනීමට (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, බැංකුවට මෙයින් බලය පවරනු ලැබේ.

(2) (අ) ඒ ස්ථානයෙහි මුල් අයිතිකරු විසින් හෝ ඒ මුල් අයිතිකරු මියගොස් ඇති හෝ උමතුව සිටින හෝ ක්‍රියා කිරීමට වෙනත් ලෙසකින් අපොහොසත්ව සිටින අවස්ථාවක ඒ තැනැත්තාගේ භාර්යාව/ස්වාමිපුරුෂයා විසින් හෝ, යම් පැවත එන්නකු විසින් හෝ, ඒ තැනැත්තාගේ ජීවත්ව සිටින භාර්යාව/ස්වාමි පුරුෂයා හෝ පැවත එන යමකු නොමැති නම් ඒ තැනැත්තාගේ දෙමව්පියන්ගෙන් කෙනෙකු හෝ සහෝදරයකු හෝ සහෝදරියක විසින් හෝ ඒ වෙනුවෙන් බැංකුවට ඉල්ලීමක් කර ඇතහොත් මිස; හෝ

(ආ) 1968 අංක 33 දරන පනතින් සංශෝධිත ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ Vඅ පරිච්ඡේදය යටතේ ලංකා රජයේ උකස් බැංකුව වෙත ඒ වෙනුවෙන් ඉල්ලීමක් කලින් ඉදිරිපත් කර තිබුණේ නම් හා ඒ ස්ථානය අත්කර නොගත යුතු යයි රජයේ උකස් බැංකුව තීරණය කර තිබුණේ නම් හෝ ඒ ස්ථානය සම්බන්ධයෙන් වූ සතුකර ගැනීමේ

ආඥාවක් ඉහත කී පරිදි සංශෝධිත ඒ ආඥාපනතේ 70අ වන වගන්තිය යටතේ අවසතු කිරීමේ ආඥාවක් මගින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබ තිබුණේ නම්; හෝ

(ඈ) ඉල්ලීම ඉදිරිපත් කරන තැනැත්තාගේ හා ඔහු ප්‍රධානයා වූ පවුලේ අනිකුත් සාමාජිකයන්ගේ, ආදායම් බදු පැනවීමට අදාළ නීතියේ විධිවිධාන යටතේ ගණන් බලනු ලබන්නා වූ ද ඉල්ලීම ඉදිරිපත් කිරීමේ දිනයට පෙරාතුව ම වූ තක්සේරු වර්ෂ තුන සඳහා වූ ද සාමාන්‍ය ව්‍යවස්ථාපිත ආදායම රුපියල් දහදාහකට නොවැඩි බවට බැංකුව සෑහීමට පත්වූවහොත් මිස; හෝ

(ඇ) ඉල්ලීම අදාළ වන ස්ථානය ඒ ස්ථානයේ අයිතිකරුගේ හෝ ඒ අයිතිකරුගේ පවුලේ යම් සාමාජිකයකුගේ පදිංචි ස්ථානයක් වශයෙන් පාවිච්චි කිරීම සඳහා හෝ ඒ අයිති කරුගේ හෝ ඔහුගේ පවුලේ යම් සාමාජිකයකුගේ යම් වෙළඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක, රක්ෂාවක හෝ සේවා නියුක්තියක කාර්යයන් සඳහා යුක්ති සහගතව අවශ්‍ය වී ඇතැයි ද ඉල්ලීම අදාළ වන ස්ථානය යම් කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලැබේ ද ඒ කාර්යය සඳහා පාවිච්චි කළ හැකි අන් කිසි ස්ථානයක් ඒ අයිතිකරුට හෝ ඔහුගේ පවුලේ සාමාජිකයකුට නැතැයි ද බැංකුව සෑහීමට පත් වූවහොත්; හෝ

(ඉ) යම් කෘෂිකාර්මික ස්ථානයකට අදාළ වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් වූ විට ඉල්ලුම්කරු ප්‍රමාණයෙන් අක්කර දහයකට වැඩි වෙන යම් කෘෂිකාර්මික ස්ථානයක අයිතිකරු නොවන්නේ යයි බැංකුව සෑහීමට පත්වන්නේ නම් මිස

(1) වන උපවගන්තිය යටතේ කිසිම ස්ථානයක් අත්කර නොගත යුතු ය.

මේ උපවගන්තියේ (ඈ) ඡේදයේ කාර්යයන් සඳහා යම් කිසි තැනැත්තකු සම්බන්ධයෙන්, "පවුලේ සාමාජිකයෙක්" යන්න යෙදෙන විට, ඒ තැනැත්තාගේ භාර්යාව/ස්වාමි පුරුෂයා හෝ ඒ තැනැත්තාගේ වයස අවුරුදු දහ අටට වැඩි යම් පුතෙක් හෝ දුවක් හෝ ඒ තැනැත්තාගෙන් යැපෙන යම් දෙමව්පියෙක්, සහෝදරයෙක් හෝ සහෝදරියක් අදහස් වේ.'; තවද,

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(2අ) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් ස්ථානයක් අත්කර ගැනීම සඳහා වූ ඉල්ලීමක් බැංකුව විසින් භාරගනු ලබන අවස්ථාවක, බැංකුව විසින්—

(අ) ස්ථානයෙහි අයිතිකරුට ඒ පිළිබඳ දැන්වීමක් ලියාපදිංචි කළ තැපෑලෙන් යැවීමට සැලැස්වීම; සහ

(ආ) ඒ ස්ථානය පිළිබඳ නියමිත විස්තර දක්වමින් සහ මේ පනතේ මේ කොටස යටතේ ඒ ස්ථානය අත්කර ගත හැකි බව ප්‍රකාශ කරමින් දැන්වීමෙහි පිටපතක් ලියාපදිංචි කිරීම සඳහා උචිත ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත භාර දීමට හෝ යැවීමට සැලැස්වීම

කළ යුතු ය.

ඉඩම් කෙරෙහි බලපාන්නා වූ හෝ ඉඩම්වලට සම්බන්ධ වූ නීත්‍යානුකූල ලේඛනයක් ලියාපදිංචි කිරීම සඳහා ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතෙහි නියමිත ආකාරයට (ආ) ඡේදය යටතේ වූ සෑම දැන්වීමක් ම ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කළ යුතු අතර එය ඒ දැන්වීමෙහි දැක්වෙන නියමිත විස්තර අදාළ වන ස්ථානය කෙරෙහි බලපාන්නා වූ හෝ ඊට සම්බන්ධ වූ නීත්‍යානුකූල ලේඛන යක් වශයෙන් ඒ කාර්යයන් සඳහා සැලකිය යුතු ය :

එසේ වුවද, මේ පනතේ මේ කොටසේ කාර්යයන් සඳහා ඒ ස්ථානය අත්කර නොගත යුතු යයි බැංකුව නිශ්චය කරතහොත් ඒ දැන්වීම බැංකුව විසින් වහාම අවලංගු කර එම අවලංගු කිරීම පිළිබඳ ලිඛිත දැන්වීමක් ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවිය යුතු අතර ඉඩම් රෙජිස්ට්‍රාර් විසින් එම අවලංගු කිරීම ලියාපදිංචි කළ යුතු ය.

(2ආ) (අ) යම් ස්ථානයක් සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීමක් පිළිබඳව (2අ) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් ඒ ස්ථානයෙහි අයිතිකරුට ලැබුණු අවස්ථාවක බැංකුව විසින් ඒ ඉල්ලීම අවලංගු කරතහොත් හෝ කරන තුරු ඒ අයිතිකරු විසින් ඒ ස්ථානය විකිණීම, තෑගි දීම, පැවරීම, බදුදීම, උකස් කිරීම හෝ අන් ආකාරයකින් අන් සතු කිරීම නොකළ යුතු ය.

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන කඩ කරමින් යම් ස්ථානයක් විකිණීම, තෑගි දීම, පැවරීම, බදු දීම, උකස් කිරීම හෝ අන් ආකාරයකින් අන්සතු කිරීම ශූන්‍ය හා බල රහිත විය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට පහත සඳහන් අලුත් උප වගන්ති ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(7) (5) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක සඳහන් දිනයෙහි හා වේලාවෙහි සහ ස්ථානයෙහි දී, ඒ ස්ථානයෙහි පදිංචි හෝ ඒ ස්ථානය සතුව සිටින යම් තැනැත්තකු හෝ ස්ථානය පිළිබඳ සම්බන්ධතාවක් ඇති තැනැත්තකු හෝ ඔහුගේ බලය ලත් අනුයෝජිතයා පැමිණ නොසිටියහොත් හෝ එවැනි තැනැත්තකු පැමිණ සිටි නමුත්, ඒ ස්ථානයෙහි සන්තකය බලය ලත් නිලධරයා විසින් භාරගැනීමට ඉඩදීම ඔහු ප්‍රතික්ෂේප කරතහොත් ඒ ස්ථානය පිහිටා ඇති ප්‍රදේශය කෙරෙහි අධිකරණ බලය

ඇති දිසා අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ විට හා (2) වන උපවගන්තිය යටතේ කරන ලද සතු කිරීමේ ආඥාව ඉදිරිපත් කළ විට ඒ ස්ථානයෙහි සන්තකය භාරදීම සඳහා වූ ආඥාවක් ලබා ගැනීමට බලය ලත් නිලධරයාට හිමිකම් තිබිය යුතු ය.

(8) (7) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම ඉල්ලීමක්ම සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අනුව ලසු ක්‍රමයට ඉදිරිපත් කළ යුතු අතර ඒ ක්‍රමයට ඒ සම්බන්ධයෙන් සුදුස්සක් කළ යුතු ය. තවද ඉල්ලීමට සම්බන්ධ දේපළෙහි වටිනාකම ම් ඇති දේපළක සන්තකය භාරදීම සඳහා දිසා අධිකරණයක් දුන් තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවෙහි යෙදවීම පිණිස වූ ඉල්ලීමකදී හා ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ නීති කෘත්‍යවලදී, තත් කාලයෙහි වලංගුව පවත්නා යම් ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු ප්‍රමාණ අනුව මුද්දර ගාස්තු හා වෙනත් ගාස්තු පිළිවෙළින් ඒ එක් එක් ඉල්ලීමේ කාර්‍ය සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම ලේඛන සඳහා සහ ඒ ඉල්ලීම සම්බන්ධයෙන් පවත්වනු ලබන සියලුම නීති කෘත්‍ය සඳහා ගෙවනු ලැබිය යුතු ය.".

72අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 72අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

'සතු කිරීමේ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීම.

72අ. (1) සතු කිරීමේ ආඥාවක බලය ප්‍රකාර යම් ස්ථානයක් බැංකුව වෙත සතු කරනු ලැබුවද, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන (මින් මතු මේ වගන්තියෙහි "අවසතු කිරීමේ ආඥාව" වශයෙන් සඳහන් කරනු ලබන) තදනන්තර ආඥාවකින් අමාත්‍යවරයා විසින් ඒ සතු කිරීමේ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

(2) යම් ස්ථානයක් සම්බන්ධයෙන් වූ සතු කිරීමේ ආඥාවක් අවසතු කිරීමේ ආඥාවකින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ යම් අවස්ථාවක පහත සඳහන් විධිවිධාන අදාළ විය යුතු ය :—

(අ) ඒ සතු කිරීමේ ආඥාවෙහි බලය ප්‍රකාර ඒ ස්ථානය බැංකුව වෙත කිසි විටකත් සතු වී නැතැයි සැලකිය යුතු අතර, ඒ ස්ථානය සම්බන්ධයෙන් හෝ කෙරෙහි යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පිළිබඳව පැන නැගිය හැකි යම් ප්‍රශ්නයක් ඒ අනුව නිශ්චය කළ යුතු ය; තවද

(ආ) සතු කිරීමේ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබී මට පෙර ඒ ස්ථානය සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය පිළිබඳව මේ පනතේ මේ කොටස යටතේ වූ සියලු හිමිකම් පෑම් සහ ඒ හිමිකම් පෑම් සම්බන්ධයෙන් මේ පනතේ මේ කොටස යටතේ පවත්වනු ලැබූ සියලුම නීති කෘත්‍ය ශූන්‍ය හා බල රහිත ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනතෙහි අන් යම් විධිවිධානවල හෝ අන් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද මේ වගන්තියෙහි පෙරාතුව වූ විධිවිධාන බලපැවැත් විය යුතු ය.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"මේ පනතේ මේ කොටස යටතේ බැංකුව වෙත සතු කරනු ලැබූ ස්ථාන සම්බන්ධයෙන් වන්දි.

76. බැංකුව වෙත සතු කරනු ලැබූ යම් ස්ථාන යක් සම්බන්ධයෙන් මේ පනත යටතේ ගෙවිය යුතු වන්දි ප්‍රමාණය, වන්දි විනිශ්චය අධිකාරය විසින් නිශ්චය කළ හැකි පොලියක් ද ඒ ස්ථානය සම්බන්ධයෙන් සතු කිරීමේ ආඥාව පළ කිරීමට පෙර ඒ ස්ථානය පිළිබඳ සම්බන්ධතාවක් ඇරු යම් තැනැත්තකු විසින් ඒ ස්ථානය පිළිබඳව කරනු ලැබූ එකතු කිරීම් හා වැඩි දියුණු කිරීම් කිසිවක සාධාරණ වටිනාකමට සමාන අතිරේක මුදලක් ද සමග, ඒ ස්ථානය මිලට ගැනීම සඳහා එහි අයිති කරු විසින් ගෙවූ හෝ එය ඔහුට පවරනු ලැබූ නියම මිල හෝ ඒ ස්ථානයෙහි වෙළඳ අගය යන මෙයින් අඩු කුමක් ද එය විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 92 වන වගන්තිය මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන අතර, ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ඇතුළුවීම, මැනීම ආදිය සඳහා ඇති බලය.

92. (1) මේ පනතේ මේ කොටස යටතේ අත්කර ගැනීමට බැංකුවට බලය පවරා ඇති යම් ස්ථාන යක් පරීක්ෂා කිරීම, විභාග කිරීම හෝ මැනීම අවශ්‍යයයි බැංකුව සලකන අවස්ථාවක, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් අවශ්‍ය විය හැකි තැනැත්තන්, ආම්පන්න, උප කරණ, වාහන සහ සතුන් හා සමග එහි ඇතුළු වී ඒ ස්ථානයෙහි මට්ටම් ගැනීම හා ඒ ස්ථානය පරීක්ෂා කිරීමේ, විභාග කිරීමේ හෝ මැනීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි එවැනි වෙනත් සියලු ක්‍රියා කිරීම නීත්‍යානුකූල විය යුතු ය :

එසේ වුව ද, එම ස්ථානයෙහි අයිතිකරු හෝ පදිංචිකරු වෙත, එම ස්ථානයට ඇතුළු වීමට හෝ එම ස්ථානයෙහි යම් ක්‍රියාවක් කිරීමට තමා අදහස් කරන බවට දින හතකට නොඅඩු දැන්වීමක් නියමිත ආකාරයට කිරීමෙන් පසුව මිස, මේ වගන්තියේ ඉහතින් සඳහන් වූ විධිවිධාන අනුව තමා වෙත පවරන ලද බලතල අනුව යම් ස්ථානයකට ඇතුළුවීම හෝ ඒ ස්ථානයේ යම් ක්‍රියාවක් කිරීම කවර තැනැත්තකු විසින් හෝ නො කළ යුතු ය.

(2) (1)වන උපවගන්තිය යටතේ බලය පවරනු ලැබූ යම් තැනැත්තකු, එසේ කිරීමට බලය පවරනු ලැබූ යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීමෙන්—

(අ) වළක්වන, ඔහුට බාධා කරන හෝ විරුද්ධකම් පාන ; හෝ

(ආ) යම් කෙනකු ලවා නියමින් හෝ අනියමින් වළක්වන, ඔහුට බාධා කරවන හෝ විරුද්ධකම් පාන

සෑම තැනැත්තෙක්ම මේ පනතේ මේ කොටස යටතේ වරදකරුවෙක් වන්නේය. මහේස්ත්‍රාත් වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ඔහු එක් අවුරුද්දකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාර ගත කරනු ලැබීම හා දඩය යන දෙකටම යටත් විය යුතු ය.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 96අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:— 96අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

" ලංකා රජයේ උකස් බැංකුවට ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීම මහජන බැංකුවට ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීම ලෙස සැලකිය යුතු බව.

**96අ.** 1968 අංක 33 දරන පනතින් සංශෝධිත ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ 70ම වන වගන්තිය යටතේ යම් තැනැත්තකු යම් ස්ථානයක් කුලියට දෙන ලද්දේ යම් ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙන් ද ඒ ඉල්ලීම නොවන, ඒ ආඥාපනතේ 70ආ (2) වන වගන්තිය යටතේ ලංකා රජයේ උකස් බැංකුව වෙත කරනු ලැබූ සෑම ඉල්ලීමක්ම, මේ පනතේ 71(2) වන වගන්තිය යටතේ මහජන බැංකුව වෙත කරනු ලැබූ ඉල්ලීමක් ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව,—

(1) ලංකා රජයේ උකස් බැංකුව විසින්, ඒ බැංකුව වෙත කරන ලද යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් ඒ ආඥාපනතේ 70අා (6) වන වගන්තිය යටතේ කරනු ලැබූ යම් නිශ්චයක්, මේ පනතේ 71 (3) වන වගන්තිය යටතේ මහජන බැංකුව විසින් කරනු ලැබූ නිශ්චයක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(2) ලංකා රජයේ උකස් බැංකුව වෙත කරන ලද එකී යම් ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙන්, එම බැංකුව වෙත එම ආඥාපනතේ 70ඇ (3) වන වගන්තිය යටතේ සතු කරන ලද යම් ස්ථානයක් මේ පනතේ 72(3) වන වගන්තිය යටතේ, මහජන බැංකුව වෙත සතු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය;

(3) ලංකා රජයේ උකස් බැංකුව වෙත කරන ලද එකී යම් ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙන්, එම ආඥාපනත යටතේ පිහිටුවන ලද වන්දි විනිශ්චය අධිකාරය විසින් ඒ ආඥාපනතේ 70ඛ වන වගන්තිය යටතේ කරනු ලැබූ යම් තීරණයක් මේ පනත යටතේ පිහිටුවන ලද වන්දි විනිශ්චය අධිකාරය විසින් මේ පනතේ 90 වන වගන්තිය යටතේ කරනු ලැබූ තීරණයක් ලෙස සලකනු ලැබිය යුතු ය; තවද

(4) රජයේ උකස් බැංකුව වෙත කරනු ලැබූ ද මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාර මහජන බැංකුව වෙත කරනු ලැබූ ඉල්ලීමක් ලෙස සලකනු ලබන්නා වූ ද එකී යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් රජයේ උකස් බැංකු ආඥාපනතේ විධිවිධාන යටතේ එම බැංකුව විසින් කිරීමට නියමිත සියලු වැඩි දුර කටයුතු කිරීම ද, ගැනීමට නියමිත සියලු ක්‍රියා මාර්ග හෝ පියවර ගැනීම ද මේ පනතෙහි අනුරූප විධිවිධාන යටතේ මහජන බැංකුව විසින් කළ යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 98අ වන වගන්තිය ඉවත් කිරීම.*

8. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ (1968 අංක 33 දරන පනතින් ඇතුළත් කරන ලද) 98අ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) මේ පනත ආරම්භවීමේ දින සිට, ප්‍රධාන ප්‍රඥප්තියේ 71(2) වන වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීම් මහජන බැංකුව වෙත ඉදිරිපත් කිරීම හෝ මහජන බැංකුව විසින් භාර ගැනීම හෝ කළ හැකි ය.

## II වන කොටස

### ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතෙහි කරනු ලබන සංශෝධන

9. ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ Vඅ වන පරිච්ඡේදයේ 70ඉඉ වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ආඥාපනතේ ඒ පරිච්ඡේදයේ 70ඊඊ වන වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය :— 398 වන අධිකාරයෙහි 70ඊඊ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයෙහි හෝ ඉන් පසුව 70ආ (2) වන වගන්තිය යටතේ කිසිම ඉල්ලීමක් භාර නොගත යුතු බව.

**70ඊඊ.** මේ පරිච්ඡේදයේ වෙන යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් වුවද, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන ආඥාවක් මගින් අමාත්‍යවරයා විසින්, ඒ සඳහා නියම කළ හැකි දිනයක හෝ ඉන් පසුව, මේ පරිච්ඡේදයේ 70ආ(2) වන වගන්තිය යටතේ වූ කිසිම ඉල්ලීමක් බැංකුව වෙත ඉදිරිපත් නොකළ යුතු ය; නැතහොත් බැංකුව විසින් භාර නොගත යුතු ය.".

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි, (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.